26

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1859/8 - 2014 අප්‍රේල් මස 22 වැනි අඟහරුවාදා - 2014.04.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/1978(xii).

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

### 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මම, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත මේ නියමය මගින් (2011 ජුනි මස 24 වැනි දින අංක 1711/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) එකී පනතේ 139 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමයක් ලෙස සලකනු ලැබිය යුතු සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය පිහිටුවනු ලැබූ නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ දැක්වෙන "පීඨය" යන ශීර්ෂය යටතේ දැක්වෙන "ව්‍යවහාර විද්‍යා පීඨය" යන අයිතමය සහ ඊට අනුරූපීව, එම උපලේඛනයේ II වැනි තීරුවේ "අධ්‍යයන අංශ" යන ශීර්ෂය යටතේ දැක්වෙන සියලුම අයිතම ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්, එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

| "*I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| *පීඨය* | *අධ්‍යයන අංශ* |
| ව්‍යවහාර විද්‍යා පීඨය | 1. ගණිත විද්‍යා අධ්‍යයන අංශය |
| | 2. භෞතික විද්‍යා අධ්‍යයන අංශය |
| | 3. රසායන විද්‍යා අධ්‍යයන අංශය |
| | 4. උද්භිද විද්‍යා අධ්‍යයන අංශය |
| | 5. වන සහ පරිසරික විද්‍යා අධ්‍යයන අංශය |
| | 6. සත්ත්ව විද්‍යා අධ්‍යයන අංශය |
| | 7. පරිගණක විද්‍යා අධ්‍යයන අංශය |
| | 8. ආහාර විද්‍යා සහ තාක්ෂණ අධ්‍යයන අංශය |
| | 9. සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන අංශය". |

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2014 අප්‍රේල් මස 09 වැනි දින,
කොළඹ දී ය.

05-134

1A - PG 2039— 565 (2014/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.